**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

**පුවත්පත් නිවේදනය**

**ඉන්දියානු විද්‍යා හා පර්යේෂණ සහයෝගිතා වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ**

ඉන්දියාවේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව ඉන්දියානු විද්‍යා හා පර්යේෂණ සහයෝගිතා වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවයි.

මෙම සහයෝගිතා වැඩසටහන මඟින් හවුල්කාර රටක පර්යේෂකයන්ට / විද්‍යාඥයින්ට ඉන්දියානු විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතනවල විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ විවිධ අංශයන්හි පර්යේෂණ හා සංවර්ධන කටයුතු මාස 3-6 අතර කාලයක් සිදු කිරීමට අවස්ථාව ලබා දෙයි . මෙම සහයෝගිතා වැඩසටහන යටතේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගමනා ගමනය සඳහා ආධාර, ආහාර දීමනා සහ අවිනිශ්චිත වියදම් සඳහා ප්‍රදානයන් ලබා දෙනු ඇත.

උනන්දුවක් දක්වන අයදුම්කරු ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු අතර ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයක හෝ පර්යේෂණ ආයතනයක ඉංජිනේරු සහ වෛද්‍ය විද්‍යාව ඇතුළු විද්‍යා හා තාක්ෂණයට අදාළ පර්යේෂණයක / පර්යේෂණවල ක්‍රියාකාරීව නිරත විය යුතුය. අවුරුදු 3 - 5 ක පර්යේෂණ හෝ ගුරු පළපුරුද්ද සහ වයස අවුරුදු 45 ට අඩු (2019 දෙසැම්බර් 31 දින වන විට) Ph.D / M.Tech / M.Sc / MBBS සුදුසුකම් ඇති අයදුම්කරුවන්

මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි. මව් රටේ ආචාර්ය උපාධියක් සඳහා ලියාපදිංචි අයදුම්කරුවන්ටද මේ සඳහා අයදුම් කළ හැකිය.

මේ සඳහා අයදුම් කිරීම සඳහා ආකෘති අයදුම්පත ඉන්දියාවේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ (www.ccstds.tn.nic.in) වෙබ් අඩවියෙන්, විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුවේ (www.dst.gov.in) වෙබ් අඩවියෙන් බාගත හැකිය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අනිවාර්ය ලියකියවිලි සමඟ අධ්‍යක්ෂක (ජාත්‍යන්තර සම්බන්ධතා), තාක්ෂණ හා පර්යේෂණ සංවර්ධන අංශය, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය, 3 වන මහල, සෙත්සිරිපාය, පළමු අදියර , බත්තරමුල්ල වෙත තැපැලෙන් හෝ motrtrd@gmail.com යන විද්‍යුත් ලිපිනයට 2020 පෙබරවාරි 28 හෝ ඊට පෙර ලැබීමට සලස්වන්න.

****

කොළඹ

2020 ජනවාරි 6